# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1659/20 - 2010 ජූනි මස 23 වැනි බදාදා - 2010.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2007 අංක 1 දරන ගුවන් සංතරණ (ගුවන් ආරක්ෂක) නියෝග

2007 අංක 1 දරන ගුවන් සංතරණ (ගුවන් ආරක්ෂක) නියෝගවල 2 වැනි නියෝගය ප්‍රකාර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබන නිවේදනය.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2010 මැයි මස 19 වැනි දින,
කොළඹ 3,
සිවිල් ගුවන් සේවා අධිකාරියේ දී ය.

2007 අංක 1 දරන ගුවන් සංතරණ (ගුවන් ආරක්ෂක) නියෝගවල 2 වැනි නියෝගය ප්‍රකාර වැඩ බලන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2007 නොවැම්බර් මස 23 දින වැනි නිකුත් කරනු ලැබූ අති විශේෂ ගැසට් නිවේදන අංක 1524/16 හි, අංක 2 හි 2.3 (ඉ) කොටස පහත දැක්වෙන ආකාරයට වෙනස්විය යුතු බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

2.3 (ඉ) : ගමනාන්තයට ළඟාවීම දක්වා වූ සම්පූර්ණ පියසරය සඳහා ඒ. ඩී. සී. අංකයක් වලංගු වේ. ඒ. ඩී. සී. අංකයක් නිකුත් කළාට පසුව සැලසුම් කරන ලද ආරම්භ කිරීමේ වේලාවට (ඕෆ් බ්ලොක් ටයිම්) වඩා විනාඩි 30 කට පෙර ගුවන් යානය පිටත් විය හැකි ය. සැලසුම් කරන ලද ආරම්භ කිරීමේ වේලාව (ඕෆ් බ්ලොක් ටයිම්) ට වඩා පැය 1 කට වඩා වැඩි කාලයක් ප්‍රමාදවන්නේ නම් අළුත් ඒ. ඩී. සී. අංකයක් ලබාගත යුතු ය.

07-255


1A - G 13024—360 (2010/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.